**කැස්බෑව නගර සභාව - 2023**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කැස්බෑව නගර සභාවේ2023දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.41,559,191ක් දැක්විය යුතු වුවද රු.59,044,091ක් දක්වා තිබුණි. | දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.57,837,591 ක වටිනාකම නිවැරදි බව. | ප්‍රමිතියට ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලී බඩු යටතේ රු.5,560,527 ක වටිනාකමින් යුත් ලී බඩු නොවන වෙනත් අයිතම ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි අයිතමය හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදි අයිතම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 31 ඡේදය | සභාව සතු වාහන 26 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීකෂාව සිදු කර අවසන්ව ඇති අතර එම වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 564,836.406 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.175,382,222 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) |
| වරිපනම් හා බදු | 84,000,000 | 90,943,319 | 50,671,439 | 33,328,561 | 84,000,000 | 84,000,000 | 50,162,444 | 33,834,556 |
| කුලී | 32,340,000 | 29,898,000 | 28,236,964 | 3,517,241 | 15,500,000 | 12,656,200 | 13,699,622 | 1,239,839 |
| බලපත්‍ර ගාස්තු | 1,550,000 | 1,625,400 | 1,625,400 | - | 1,500,000 | 1,488,000 | 1,488,000 | - |
| වෙනත් ආදායම් | 260,000,000 | 378,626,527 | 378,656,527 | - | 290,000,000 | 315,000,000 | 315,000,000 | - |
| එකතුව | 377,890,000 | 501,093,246 | 459,190,330 | 36,845,802 | 391,000,000 | 413,144,200 | 380,350,066 | 35,074,395 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අය කර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශ අනුව 2023 දෙසැම්බර් දිනට 31 හිඟ වරිපනම් හා බදු ශේෂය රු.64,976,468ක් වූ අතර රු.50,000ක් ඉක්මවූ වරිපනම් ඒකක 62කින් අයවිය යුතු හිඟහිටි ශේෂය රු.6,777,382ක් විය. | 2024.01.01 දිනට රු.50,000/- ඉක්මවූ වරිපනම් ඒකක 62කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.6,771,382 වන අතර 2024.04.01 වන විට ඉන් දේපල 05 සඳහා කොටස් වශයෙන් හා සම්පූර්ණ ලෙස රු.808,631.61ක් අය කරගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ වරිපනම් ආදායම රු.84,000,000 ක් වුවද බිල් කරන ලද වරිපනම් ආදායමින් රු.28,041,060 ක් හෙවත් සියයට 33.38ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | මෙම වරිපනම් බදු අයකර ගැනීම සඳහා 2023 වර්ෂයේ ජංගම සේවා පැවැත්වීම සහ දේපල තහනම් කිරීම කර ඇති බව. | ප්‍රවර්ධන ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශ අනුව 2023 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය වූ රු.68,572,810කින් සමාලෝචිත වර්ෂය තුලදී රු.26,686,685ක් හෙවත් සියයට 39ක් අයකරගෙන තිබූ අතර රු.41,886,125ක් හෙවත් සියයට 61ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම වරිපනම් බදු අයකර ගැනීම සඳහා 2023 වර්ෂයේ ජංගම සේවා පැවැත්වීම සහ දේපල තහනම් කිරීම කර ඇති බව. | -එම -. |
| (ඈ) | විනෝද බදු රු.281,047ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වරිපනම් වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවත්, සභාව 2012/2013 වර්ෂ වලදී අවසන් වරට තක්සේරු කර තිබූ අතර එම වර්ෂයන් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | වරිපනම් තක්සේරු කිරීම සඳහා 2021 වර්ෂයේ සිට තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති අතර වැය ප්‍රතිපාදන ද වෙන් කර ඇතත් මේ වන තෙක් ඒ සම්බන්ධව කටයුතු කර නොමැති අතර මේ වර්ෂය තුළදී තක්සේරුව සිදු කිරීමට කටයුතු කරන බව. | වරිපනම් තකසේරු කළ යුතුය. |
| (ඊ) | කසළ බැහැර කිරීම වෙනුවෙන් 2023 ජනවාරි 01 දිනට පැවැති රු.1,208,759ක් වූ හිඟයෙන් රු.1,156,259ක් එනම් සියයට 22ක් 2023 වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු කසළ බදු වටිනාකම රු.2,542,643ක් විය. | 2023.12.31 දිනට අයවිය යුතු මුළු කසළ බදු වටිනාකම රු.2,542,135/- ක් වන බව. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | දිගුකාලීනව බදු දෙන කඩ කාමර සඳහා 2023 වර්ෂයට අදාලව බිල්කරන ලද රු.29,898,000ක ආදායමෙන් රු.1,676,690ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ කඩකුලී ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | වාරික 10ට වැඩි දේපල 10ක රු.532,800ක් වූ හිඟ කඩකුළි ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි මුදල්ද අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ දේපල ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 2001 වර්ෂයට පෙර සිට පැවත එන රු.593,065ක් ද 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.446,600ක් ද වශයෙන්අයවිය යුතුව පැවති මාළු කඩ හිඟ කුලි ශේෂ 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇති අතර ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කර විගණනය වෙත වාර්තා කරන බව. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ 122 කින් අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම රු.2,861,841ක් වූ අතර, රු.100,000ට වැඩි බදුකරුවන් 04 දෙනෙකුගෙන් ද, රු.50,000ට වැඩි බදුකරුවන් 09 දෙනෙකුගෙන් ද සමන්විත විය. | ඉතිරි මුදල්ද අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩකුලී ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | 2023 ජනවාරි 01 දිනට වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දුන් රථ වාහන ගාල් කිරීමේ දේපළට අදාළ මුළු හිඟය රු.440,882ක් ද පොදු වැසිකිළි හිඟ ශේෂය රු.45,790ක් ද ආපන ශාලාව සඳහා හිඟය රු.265,000ක් වුවද සමාලෝචිත වර්ෂය තුළදී රු.499,622ක් පමණක් අයකර ගෙන තිබුණි. | රු.206,260 ක හිඟ මුදල කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇති අතර පොදු වැසිකිළියෙන් ඉතුරු මුදල් අය කර ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ක) | 2017 වර්ෂයේ සිට පැවත එන හිඟහිටි මුද්දර ගාස්තු රු191,823ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 අදාළ හිඟ ශේෂයක් වන අතර උපලේඛන පිළියෙල කර පළාත් ආදායම් දෙපාර්තුමේන්තුව වෙත භාර දුන්නද 2017ට අදාළ තොරතුරු ඔවුන් සතුව නොපවතින බව පවසා නැවත හරවා ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට<br>කටයුතු කළ යුතුය. |
| (ග) | ලේඛන ගත කරන ලද සම්ප්‍රේෂණ කුළුණු 41 න් 08ක වටිනාකම් තක්සේරු කර නොතිබුණු අතර, තක්සේරු වටිනාකම් සහිත කුළුණු 21කින් සභාවට රු.1,451,008ක ආදායමක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | තක්සේරු නොවූ කුළුණු තක්සේරු කිරීම සඳහා අදාළ ආයතනවලට ගොඩනැගිලි සැලැස්මේ පිටපත් එවන ලෙස දැනුම් දී ඇති අතර කුළුණු වලින් මේ වන විට අය විය යුතු මුදල් අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතින බව.. | කුළුණු තක්සේරු කර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය.. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේ සිට පැවත එන පුද්ගලික ආයතනයක් වෙතින් අය විය යුතු රු.169,203 ක අත්තිකාරම් මුදල පියවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කර නොමැතිවීම හේතුවෙන් ඉතිරි අත්තිකාරම් මුදල වන රු.169,203 පියවාගෙන නොමැති බව. | ලැබිය යුතු මුදල් නොපමාව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතන සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 | චක්‍රලේඛයේ හා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය අනුව ලද උපදෙස් පරිදි 2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන සඳහා ප්‍රත්‍යාගණනය සිදුකර ගිණුම් ගත කළ බව දන්වා සිටින අතර, සභාව සතු අනිකුත් ස්ථාවර වත්කම් සඳහා | සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් නගර සභාව විසින් 2023 වර්ෂයේදී ද ඉඩම්, ගොඩනැඟිලි, වාහන හැර අනෙක් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය සිදු කරමින් පවතින බව. | |
| (ඇ) | සභාව සතු වාහන 05 ක මයිලෝ මීටර් අක්‍රියව තිබූ අතර ඉන්ධන දහන පරීක්ෂාව නිසි පරිදි සිදු කර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු අවසන් වූ වහාම ඉන්ධන පරීක්ෂාව සිදුකර විගණනයට ඉදිරිපත් කරන බව. | ඉන්ධන දහන පරීක්ෂාව කළ යුතු ය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.6,030,286 ක පළාත් සභා ණයහිමි ශේෂය තුළ 2019 වර්ෂයට අදාළව රු.1,020 ක ශේෂයක් ද 2021 වර්ෂය සඳහා රු.3,029,266 ක ශේෂයක්ද ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පළාත් සභා ණය හිමි ශේෂය තුළ 2019 වර්ෂයට අදාලව දක්වා ඇති රු.1020/- ක ශේෂය 2023 වර්ෂයේදී ගෙවූ ව්‍යාපෘතියක වැඩිපුර වෙන් කිරීම් වේ. එය ඉදිරියේදී කපා හැරීමට නියමිතය. 2021 වර්ෂය සඳහා දක්වා ඇති රු.3,29,266/- ක ශේෂයෙන් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 8ක මුදල් ග්‍රාමීය මාර්ග අමාත්‍යාංශයෙන් මෙතෙක් ලැබී නොමැති අතර, ව්‍යාපෘති 6ක් සඳහා 2024 වර්ෂයේදී මුදල් ලැබී ඇති බැවින් ඉදිරියේදී ගෙවීමට නියමිත බව. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කර්මාන්ත ණයහිමි ශේෂය තුළ ඇතුළත් 2020 සිට 2021 දක්වා ව්‍යාපෘති 16 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.3.007,011 ක ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති 16ට අදාළ ණයහිමි ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2017 සිට 2022 වර්ෂය දක්වා ටෙන්ඩර් ඇප තැන්පත් රු.2,428,683 ක් නිරවුල් කර නොතිබුණි. | ටෙන්ඩර් ඇප තැන්පත් ඉදිරියේදී නිරවුල් කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ වාහන 02 අක්‍රීය තත්වයේ පැවතුණ අතර, ෆයිබර් බෝට්ටුව මඩපාත කසළ අංගනයේ භාවිතයට නොගෙන තිබුණි. | මොටර් ග්‍රේඩරය හා කම්පැක්ටරය සඳහා අළුත්වැඩියාවන් සිදු කිරීමට අදාළව මිළ ගණන් කැඳවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ෆයිබර් බෝට්ටුව ආපදා තත්වයකදී භාවිතයට ගැනීමට කටයුතු කරනු ලබන බව. | වාහන හා යන්ත්‍රෝපකරණ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**.33 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.1,866,135 ක් වුවද එම ශේෂය තුල නිලධාරීන් 03 දෙනෙකුගෙ වසර 05 කට වඩා වැඩි හිඟ ශේෂය රු.299,906ක් ද නිලධාරින් 04 දෙනෙකුගේ වසර 10 කට වැඩි හිඟ ශේෂය රු.169,495 ක් ද විය. | නිලධාරින්03 දෙනෙකුගේ වසර 05කට වඩා වැඩි හිඟ ශේෂය රු.299,906.00ක් බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැස්බෑව නගර සභාවේ 2023 වසරේ අයවැය ලේඛනය මඟින් පුනරාවර්තන නොවන වියදම් සඳහා රු.309,269,600ක ප්‍රතිපාදන වෙන්කර තිබුනද සත්‍ය වශයෙන් දරා තිබූ වියදම් රු.119,664,673ක් විය. | 2023 වර්ෂයේ වියදම් පාලන චක්‍රලේඛ 3/2022 අනුව සභාවේ සියලු වියදම් අවම කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2023 වසරේ සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම අවම අගයක් ගෙන ඇති බව. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |